අ/කැඳෑ අඹගහවැව විදුහල

පිහිඹියගොල්ලෑව

සභාපති
බෝධි පූජ්‍ය පදනම
බස්දේලිගම.

දිනය : 2021/11/28

කෘතඥතාව පළ කිරීම සම්බන්ධවයි.

අනුරාධපුර කලාපයේ රඹෑව අධ්‍යාපන කොට්සයට අයත් අති දුෂ්කර පාසලක් වන මෙම විදුහලේ 1 සිට 5 දක පන්ති වල සිසුන් 49 ක් අධ්‍යාපනය ලබයි. දශකයකට අධික වූ කාලයක සිට මෙහි පානීය ජල පහසුකම් නොමැති වීම හේතුවෙන් ගුරු සිසු දෙපිරිසම දැඩි දුෂ්කරතා විඳිමින් සිටින අවධියක ඔබතුමගේ පදනම වෙත කළ ඉල්ලීමකට අනුව අද වන විට මේ දුෂ්කරතා මඟහරවා දීමට ඔබතුමන්ලා කාරුණික වී ඇති බව සතුටින් දන්වනු කැමැත්තෙමි.

ඒ අනුව රු.168 000/= ක මුදලක් වැය කොට ජල ටැංකිය නළ පද්ධතිය හා කරාම සවිකර ඇති අතර සියරා කන්ස්ට්‍රක්ෂන් සමාගම විසින් රු. 65757/= ක දායකත්වයක් ලබා දී ඇති බවද දන්වනු කැමැත්තෙමි. ජල ටැංකිය සවි කිරීමෙන් අනතුරුව වාර්ෂික ජල අවශතාව ලෙස ජලය ලීටර් 12000 ක් සඳහා රු. 12000/= ක මුදලක්ද මේ වන විට "නිල් දියවර" ජල පිරිපහදුව මධ්‍යස්ථානය වෙත ඔබතුමන් විසින් ලබා දී ඇති අතර, දරුවන්ට ජලය පරිභෝජනය කිරීමේ වැඩි පහසුව පිණිස රු. 38000/= ක මුදලක් වැය කොට පාසල් දරුවන් සහ ගුරුභවතුන් වෙනුවෙන් තත්වයෙන් උසස් ජල බෝතල්ද පරිත්‍යාග කිරීම ප්‍රශංසනීය කොට සලකමි.

දැඩි දුෂ්කරතා මැද ජීවිත ගැටගසනා මෙම දරුවන් වෙනුවෙන් ඔබ ආයතනයේ ඔබතුමන් ඇතුළු සහයෝගය දැක්වූ සියලුම මහත්ම මහත්මීන් වෙනුවෙන් අප පාසලේ ගුරු, දෙගුරු සිසු සියලුම දෙනාගේ හදපිරි කෘතඥතාව පළකරන අතර තව තවත් මෙවන් වූ සත්කාරයන් සිදුකිරීමට අවැසි ශක්තිය ධෛර්යය ලැබේවායි එක සිතින් සුභාශිංසනය කරමු. ස්තුතියි.

ඩබ්.එස්.පී.[illegible]. දිසානායක
විදුහල්පති
අ/කැඳෑ අඹගහවැව විදුහල
පිහිඹියගොල්ලෑව

Scanned with CamScanner